සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

(54)

| මගේ අංකය / எனது இல / My No. | WBB/SSNP/1/2/3 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.07. 20 |
|---|---|---|---|---|---|

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

**<u>අස්වැසුම බැංකු ගිණුම් විවෘත කිරීමට යාමේදී පැන නගින ගැටළු</u>**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින් වෙත අස්වැසුම ප්‍රතිලාභ අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ගැටළු අතර පහත සඳහන් සුවිශේෂී පොදු ගැටළු ඇති බව පෙනී ගොස් ඇත.

1. තේරීම් ලයිස්තුවේ සිටින අයදුම්කරු දැන් මිය ගොස් ඇති අවස්ථා
   - 1.1 තනි පුද්ගල පවුලක අයදුම්කරු මිය යාම
   - 1.2 බහු පුද්ගල පවුලක අයදුම්කරු මිය යාම
2. පවුලේ බාල වයස්කාර සාමාජිකයෙකු නමින් ඇති බැංකු ගිණුමක් තහවුරු කර තිබීම.
3. ශාරීරික හෝ මානසික ආබාධිත පුද්ගලයෙකු නමින් බැංකු ගිණුමක් තහවුරු කර තිබීම.
4. බැංකු මගින් තහවුරු කරන ලද සමහර බැංකු ගිණුම් දැනට අක්‍රීය වීම.
5. එකම පවුලේ සාමාජිකයින් දෙදෙනෙකු වංචා සහගත ලෙස වෙන වෙනම අයදුම් කර සුදුසුකම් ලබා තිබීම.
6. සුදුසුකම්ලාභී ලයිස්තුවේ නම සඳහන් අයදුම්කරුවෙකු ස්වෙච්ඡාවෙන් ප්‍රතිලාභ ප්‍රතික්ෂේප කිරීම.
7. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිකුත් කරනු ලබන ලිපි මත බැංකු ගිණුම් විවෘත කිරීම බැංකු මගින් ප්‍රතික්ෂේප කරන අවස්ථා.

ඉහත සඳහන් ගැටළු අතරින් අංක 1.1 හි සඳහන්, අවස්ථාවන් අංක 5හි සඳහන් අවස්ථාවන් හා අංක 6හි සඳහන් අවස්ථාවන් පිළිබඳ විස්තර ඇමුණුම් 1 ආකෘතිය අනුව මෙම මණ්ඩලය වෙත විද්‍යුත් තැපැල මගින් 2023.07.20 දිනට තත්වය වාර්තා කරන්න.

ඉහත 1.2හි සඳහන් අවස්ථාවන් වාර්තා වූ විට එම පුද්ගලයාගේ මරණය විධිමත්ව තහවුරු කරගෙන (මරණ සහතිකය මගින් හෝ ග්‍රාම සේවකගේ වර්ථාව මගින්) එම පවුලේ ඊළඟට වගකීම දරණ (බාල වයස්කරුවෙකු හැර)තැනැත්තෙකු වෙත නම සංශෝධිත ලිපියක් ගිණුම් විවෘත කිරීම සඳහා නිකුත් කළ යුතු වේ. එය පරිගණක පද්ධතියෙන් ලබා ගන්නා ලිපිය සංශෝධනය කර අත්සන් කර නිකුත් කළ හැකියි.

ඉහත අංක 1.2 හා 3හි සඳහන් අවස්ථාවලදී පරිගණක ගත ලිපියේ ආකෘතිය අනුසාරයෙන් ලිපියක් සකස් කර මෙම ලිපිය නිකුත් කිරීමට හේතුවද සඳහන් කර සුදුසුකම්ලාභී පවුලේ වෙනත් වගකිව යුතු තැනැත්තෙකු වෙත නව බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් බැංකුව වෙත නිකුත් කරන්න. එහෙත් ශාරීරික ආබාධයක් ඇති පුද්ගලයෙකු සඳහාම ප්‍රතිලාභය ලබා ගැනීමට අවශ්‍ය නම් අදාළ නිවෙස වෙත ගොස් ගිණුම් විවෘත කිරීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එකඟවී ඇත.

ඉහත අංක 4හි සඳහන් අවස්ථාවන්ට අදාළව බැංකුව මගින් තහවුරු කර තිබූ එහෙත් දැනට අක්‍රීයව ඇති ගිණුම් බැංකුව මගින් නැවත සක්‍රීය කර ගැනීමට හැකි බව දන්වා ප්‍රතිලාභීන් බැංකුව වෙත යොමු කළ යුතුය.

අංක 07හි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් ඇමුණුම් 2 අනුව නිශ්චිත විස්තර මෙම මණ්ඩලය වෙත විද්‍යුත් තැපැල මගින් දන්වා එවන්න. ඒ අනුව අදාළ බැංකු සමග සම්බන්ධීකරණය කර ගැටළු විසඳා දිය හැකිය.

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk

ඇමුණුම් 01 ආකෘතිය-

| කාරණය | අයදුම්කරුගේ නම | H.H.අංකය | මරණ සහතික අංකය |
|---|---|---|---|
| 1. තනි පුද්ගල පවුලක අයදුම්කරු මියයාම | | | |
| 2. වංචා සහගතව තොරතුරු ලබාදී සුදුසුකම් ලබා ගැනීම | | | |
| 3. ස්වෙච්ඡාවෙන් ප්‍රතිලාභ ප්‍රතික්ෂේප කිරීම | | | |

❖ මිය ගිය අවස්ථාවලදී මරණ සහතිකයේ පිටපතක් ද වංචා සහගතව තොරතුරු ලබාදී සුදුසුකම් ලබා ඇති බව අනාවරණය වූ විට ඊට සාක්ෂි ලෙස ඉදිරිපත් වූ ලිපි ලේඛණද ස්වෙච්ඡාවෙන් ප්‍රතිලාභ ප්‍රතික්ෂේප කරන අවස්ථාවන් සඳහා ලිඛිත ඉල්ලීමක්ද අමුණා එවිය යුතුය.

ඇමුණුම් 2 ආකෘතිය-

| ගැටළුව | අයදුම්කරුගේ නම | H.H.අංකය | බැංකුව | බැංකු ශාඛාව | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1. තැන්පතු මුදලක් ඉල්ලීම | | | | | |
| 2. ලිපියේ අඩුපාඩු පෙන්වීම | | | | | |
| 3. අයදුම්කරුගේ නම වෙනස්වීම | | | | | |
| 4. වෙනත් කරුණු | | | | | |

මෙමගින් ඉල්ලා සිටින සමහර විස්තර දෝශ සහිත ලෙස ප්‍රතිලාභ ගෙවීම වලක්වා ගැනීම සඳහා ඉවහල් වේ. සමහර විස්තර ප්‍රතිලාභී විස්තර ලයිස්තුව සංශෝධනය කිරීම සඳහා ප්‍රයෝජනවත් වේ. තවත් සමහර විස්තර ප්‍රතිලාභ පිරිනැමීමේදී පැන නගින ගැටලු විසඳීම සඳහා අවශ්‍ය වේ. එබැවින් ඔබේ විෂය භාර නිලධාරින් දැනුවත්කර අවශ්‍ය පියවර ගන්නේ නම් මැනවි.

මේ සඳහා ඔබෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

**ආර්.පී.ආර්. රාජපක්ෂ**
**අතිරේක කොමසාරිස් (මෙහෙයුම්)**
**කොමසාරිස් වෙනුවට**

පිටපත් - 01. සාමාන්‍යාධිකාරි , ලංකා බැංකුව
02. සාමාන්‍යාධිකාරි ,මහජන බැංකුව
03. සාමාන්‍යාධිකාරි ,ජාතික ඉතිරිකිරීමේ බැංකුව
04 සාමාන්‍යාධිකාරි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

} අවශ්‍ය කටයුතු සඳහා